## අභ්‍යන්තර වශයෙන් අවතැන් වූ පුද්ගලයන්
## ඡන්දදායකයන් ලෙස ලියාපදිංචි කිරීම - 2015

2013 අංක 27 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (විශේෂ විධි විධාන) පනතින් සංශෝධිත 1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ ප්‍රකාරව අවතැන් වූ ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීම මේ වන විට අරඹා ඇත.

ඒ අනුව මෑත අතීතයේ දී ත්‍රස්තවාදී සටන්කාමී හෝ වෙනත් කණ්ඩායමක යම් ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලයක් වශයෙන් 2009 මැයි මස 18 දිනට පෙර තමා ස්ථිරව පදිංචිව සිටි මැතිවරණ කොට්ඨාශයෙන් අවතැන් වූ හා ඊට පෙර වලංගුව පැවැති කිසියම් වර්ෂයක් සඳහා වූ නාමලේඛනයක නම ඇතුළත් වූ සහ 2009 වර්ෂයෙන් පසුව දිවයිනේ කිසිදු මැතිවරණ කොට්ඨාශයක ඡන්ද හිමි නාමලේඛනයට ඡන්ද හිමියකු ලෙස ලියාපදිංචි නොවූ තැනැත්තන්ට 2014 වර්ෂයේ ද, ඡන්ද හිමි නාමලේඛනයට නම ඇතුලත් කර ගැනීමේ අවස්ථාව ඉහාත කී විශේෂ විධි විධාන පනතින් ලබා දී ඇත.

ඒ අනුව, සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් ඉල්ලුම්පත් භාරගැනීම 2014.11.01 දින ආරම්භ කර 2014.11.07 දින අවසන් කිරීමට නියමිතය. 2014.11.07 දින දක්වා ලැබී ඇති ඉල්ලුම්පත් අනුව සුදුසුකම් ලැබූ හිමකම් ඉල්ලුම්කරුවන්ගේ ලැයිස්තුවක් සකස් කර එය 2014.11.08 දින ප්‍රදර්ශනය කිරීමට හා ඉහත සඳහන් හිමිකම් ලැයිස්තුවේ නම් සඳහන් නොවන පුද්ගලයින්ට එදින සිට සතියක කාලයක් දක්වා ඒඒ ලියාපදිංචි කිරීමේ නිලධාරී වෙත අභියාචනා ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදීමටත් නියමිතව ඇත.

මීට අදාලව ලියාපදිංචියට අවශ්‍ය පහත සඳහන් ලියකියවිලි මේ සමඟ අමුණා ඇත.

I. අවතැන් වූ තැනැත්තන් ඡන්ද හිමියන් ලෙස ලියාපදිංචි කිරීම සඳහා භාවිතා කළයුතු ඉල්ලුම් පත්‍රයේ පිටපතක්

II. ඉල්ලුම් පත්‍රය සම්පූර්ණ කිරීම සඳහා වූ උපදෙස් පත්‍රිකාවක පිටපතක්

ඒ අනුව ඉහත සඳහන් විශේෂ විධිවිධාන පනතේ 3 වන වගන්තිය මගින් විස්තර කර ඇති පරිදි පහත සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ දරුවන් වූ,

I. අභ්‍යන්තර වශයෙන් අවතැන් වූ දිනයේදී වයස අවුරුදු දහ අටට එළඹ නොසිටියා වූද, ඉල්ලීම කරනු ලබන අවස්ථාවේදී වලංගුව පැවති ඡන්ද හිමි නාමලේඛනය ප්‍රතිශෝධනය කිරීම ආරම්භ කළ දිනයේදී වයස අවුරුදු දහ අට හෝ ඊට වැඩි වයසකට එළඹ ඇත්තාවූද,

II. එම පුරවැසියා අභ්‍යන්තර වශයෙන් අවතැන්වූවකු බවට පත්වීමෙන් පසුව ඉපදී ඉල්ලීම් කරනු ලබන අවස්ථාවේදී වලංකුව පැවති ඡන්ද හිමි නාමලේඛනය ප්‍රතිශෝධනය කිරීම ආරම්භ කළ දිනයේදී වයස අවුරුදු දහ අට හෝ ඊට වැඩි වයසකට එළඹ ඇත්තා වූද,

III. 2009 වර්ෂයෙන් පසුව වලංගුව පැවති කවර හෝ නාම ලේඛනයක තමාගේ නම ඇතුළත් කරනු ලැබ නොමැති වූද, පිරිස් හට මේ සඳහා ලියාපදිංචි විය හැක.

එළඹෙන 2015 වර්ශයේ පැවැත්වීමට නියමිත සියලු මැතිවරණ සඳහා භාවිතා කිරීමට නියමිතව ඇත්තේ මෙම 2014 වර්ෂයේ ලියාපදිංචි ඡන්දදායක ලැයිස්තුව බැවින්, නොපමාව ඔබගේ ලියාපදිංචිය සඳහා කටයුතු කරන්න. වැඩිවිස්තර සඳහා http://cmev.wordpress.com වෙත පිරිසෙන්න. එසේ නොමැති නම් මැතිවරණ මහලේකම් කාර්යාලය අමතන්න. (0112-868441, 0112-868442, 0112-868443)

මංජුල ගජනායක
සම්බන්ධිකාරක